# 8. අපි ආදරෙයි අපි කීකරුයි

අපි පේළි සැදෙමු
පන්තිය වෙත යමු
අක්කලා උදවු වෙනවා



අපි ගීත ගයමු
අත් වැලක් හැදෙමු
අය්යලා උදවු වෙනවා



අපි අකුරු ලියමු
පොඩි ගණන් හදමු
අපෙ දැනුම දියුණු වෙනවා

අපි නැටුම් නටමු
අත් වැඩෙහි යෙදෙමු
ගුරුතුමී උදවු වෙනවා



පොඩි පාද තබමු
තරගයට දුවමු
ගුරුතුමා උදවු වෙනවා

ජීවිතය දිනා, හොඳ ළමයි වෙන්න
මේ සැවොම උදවු වෙනවා
අපි ආදරෙයි අපි කීකරුයි
දෙව් පියා සතුටු වෙනවා.



## පැවරුම්

පහත සඳහන් එක් එක් දේ කිරීමට උදවු වූ අය පාඩමෙන් සොයන්න. අභ්‍යාස පොතෙහි ලියන්න.

| කළ දෙය | උදවු වූ අය |
|---|---|
| 1. ජේළියට යාමට | ........................ |
| 2. ගීත ගැයීමට | ........................ |
| 3. තරගයට දිවීමට | ........................ |
| 4. නැටුම් නැටීමට | ........................ |